**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝම්බර් 08 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමූපකාර සේවා,අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

2020 අගෝස්තු මස 09 දින නිකුත් කරන ලද අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2020 වර්ෂයේ පිහිටුවන ලද නව රාජ්‍ය අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**1.6.1 තැන්පතු ලැබීම්**

**----------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් රු.1,701,372 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එය රු.665,406 ක් ලෙස රු.1,035,966 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අහෝසි වූ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් පවරා ගත් තැන්පත් ගිණුම් ලැබීම්ද පවරා ගත් අතර එම අගයන් ඉවත් කර අමාත්‍යාංශයට අයත් තැන්පතු අගය පමණක් ගෙන ඇත. | භාණ්ඩාගාර පොත් අනුව වූ වටිනාකම ඇතුලත් කල යුතුයි. |

**1.6.2 අත්තිකාරම් ලැබීම්**

**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අත්තිකාරම් ලැබීම් රු.10,558,898 ක් වුවද , මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එය රු.838,002 ක් ලෙස රු.9,720,896 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අහෝසි වූ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ශේෂයන් පවරා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂයන්ද පවරා ගන්නා ලදී. මෙහිදී රු.838,002 ක් ලෙස දක්වා ඇත්තේ මෙම අමාත්‍යාංශයේ භාණ්ඩාගාර මුද්‍රිත ශේෂ පිරික්සුම අනුව මෙම අමාත්‍යාංශයට පමණක් අදාල අගයයි. එබැවින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කරන ලද මුදල වන රු.838,002 ක් නිවැරදි වේ. | මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |

**1.6.3 තැන්පතු ගෙවීම්**

**-----------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් රු.1,580,468 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එය රු.652,805 ක් ලෙස රු.927,663 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අහෝසි වූ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ තැන්පත් ගිණුම් ගෙවීම්ද පවරා ගෙන ඇති බැවින් මෙම අමාත්‍යාංශයේ තැන්පත් ගිණුම් ගෙවීම් පමණක් භාණ්ඩාගාර මුද්‍රිතයේ ශේෂ පිරික්සුම අනුව තැන්පතු ගෙවීම් ලෙස රු.652,805 ක ගෙවීම් පමණක් දක්වා ඇත.එය නිවැරදි වේ. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය ඇතුලත් කල යුතුයි. |

**1.6.4 අත්තිකාරම් ගෙවීම්**

**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.16,787,334 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි එය රු.497,500 ක් ලෙස රු.16,289,834 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අහෝසි වූ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ගෙවීම් ශේෂය පවරා ගත් හෙයින් එම මුළු අගය අත්තිකාරම් ගෙවීම් ලෙස ශේෂ පිරික්සුමේ දක්වා තිබුණි. එහෙත් මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ට මුදලින් පමණක් ගෙවා ඇති රු.497,500 අගය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති අතර, එය නිවැරදි වේ. | මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |

### 1.6.5 මූල්‍ය වත්කම්

---------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව වූ රු.13,057 ක මුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ හා ජංගම වගකීම් යටතේ පෙන්වා නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය මහභාණ්ඩාගාරය වෙත පියවා ඇති බැවින් එය මූල්‍ය තත්වය ප්‍රකාශයේ ඇතුලත් කර නැත.එය නිවැරදිය. | භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කල යුතුය. |

### 1.6.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.28,884,309 ක් ලෙස දක්වා තිබුණ අතර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා , වැඩිදියුණු කිරීම් වියදම වූ රු.3,303,753 ක වියදම ඊට ඇතුළත් කර නොතිබුණි. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ වියදම රු.3,303,753 ක් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වියදම රු.1,193,307 ක් යන අගයන් දෙකෙහි එකතුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිළදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීමේ යටතේ රු.4,497,060 ක් ලෙස දක්වා ඇත. | මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මූලධන වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබුණ රු.700,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | අහෝසි වූ අමාත්‍යාංශයේ පැවති යන්ත්‍ර උපකරණ ලබාගැනීම හා වැඩිදියුණු කිරීමක් සිදුනොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | ප්‍රතිපාදිත මුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 15 ක් හා මූලධන වැය විෂයයන් 3 ක් සඳහා වූ එකතුව රු.23,830,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.13,420,114 ක් උපයෝජනය කර රු.10,409,886 ක ඉතිරියක් පැවතිණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් දේශීය හා විදේශිය රාජකාරි ගමන් සිමාවීම, අහෝසි වූ අමාත්‍යාංශයේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ පවරා ගැනීම, නව අමාත්‍යාංශයක් වීම නිසා වියදම් සීමා වීම, වියදම් අරපිරිමැස්මෙන් සිදු කිරීම හා කාර්මික අපනයන අංශයේ ප්‍රතිපාදන මගින් ගෙවීම් කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය. | තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට වගබලා ගත යුතුයි. |

## 2.2 අත්තිකාරම් ගිණුම් සීමා සංශෝධනය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ අවම ලැබීම් සීමාව රු.2,500,000 ක් වූ අතර එම සීමාව රු.2,000,000 ලෙස සංශෝධනය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2020 දෙසැම්බර් 31 දින මුදල් අමාත්‍යතුමා වෙත නිර්දේශ කර තිබුණද 2021 මාර්තු 30 දින වන විටත් ඊට අනුමැතිය ලබා දී නොතිබුණි. | ඉදිරි කටයුතු අයවැය දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | සීමා ඉක්මවීම් සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුයි |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ සටහන **iii** යටතේ රු.1,271,674 ක බැදීම් හා බැරකම් පෙන්වා තිබුණ ද මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශයෙහි එම වටිනාකම දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශයේ සටහන iii යටතේ රු.1,271,674 ක බැදීම් හා බැරකම් පෙන්වා තිබුණද මු.රෙ.94(2) සහ 93) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශයෙහි වටිනාකම ප්‍රමාද දෝෂයකින් දක්වා නොමැති අතර, ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | බැරකම් නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට ක්‍රියා කල යුතුයි. |